# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 දෙසැම්බර් - 2023 මාර්තු

### සමාජීය විද්‍යා පීඨය

### ආර්ථික විද්‍යාව (නව/පැරණි නිර්දේශය)

### සූක්ෂම ආර්ථික විද්‍යාව ECON – E 2015

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. අ) "සම්පත් හිඟකම සෑම ආර්ථිකයක්ම මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයකි." උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) "ආර්ථික විද්‍යාත්මක සංසිද්ධි හා සම්බන්ධ මානව හැසිරීම් විග්‍රහ කිරීමේ දී සලකා බලන විෂය කරුණු හෝ භාවිත කරන ප්‍රවේශ මත පදනම්ව ආර්ථික න්‍යාය සූක්ෂම ආර්ථිකවිද්‍යාව සහ සාර්ව ආර්ථිකවිද්‍යාව වශයෙන් කොටස් දෙකකට වෙන් කරනු ලැබේ." විමසන්න. (ලකුණු 10)

02. අ) උපයෝගිතා සංකල්පය පැහැදිලි කර මුලු උපයෝගීතාව (Total Utility) සහ ආන්තික උපයෝගීතාව (Marginal Utility) අතර වෙනස උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

ආ) "පාරිභෝගික හැසිරීම විග්‍රහ කිරීමේ දී සංඛ්‍යා සූචක ප්‍රවේශයට වඩා ක්‍රම සූචක ප්‍රවේශය වඩාත් තාර්කික වේ." විමසන්න. (ලකුණු 05)

ඇ) පරිභෝජක හැසිරීම පිළිබඳ ආන්තික උපයෝගීතා න්‍යායේ දී භාවිතා කරන උපකල්පන විස්තර කර එම න්‍යාය යටතේ පරිභෝජක සමතුලිතය සඳහා වන කොන්දේසි පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. අ) උපේක්ෂා වක්‍ර විග්‍රහයේ දී භාවිතා කරන උපකල්පන පැහැදිලි කර පරිභෝජක සමතුලිතය සඳහා වන කොන්දේසි රූප සටහන් භාවිතයෙන් ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 10)

ආ) භාණ්ඩ මිල වෙනස්වීමක ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක හඳුන්වා, භාණ්ඩයක මිල අඩුවීමේ ආදේශන ප්‍රතිවිපාකය ඔබ දන්නා ප්‍රවේශයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

04. අ) හීනවන ආන්තික ඵලදා නීතිය විස්තර කර එම නීතිය අනුව මුළු ඵලදාව, සාමාන්‍ය ඵලදාව සහ ආන්තික ඵලදාව හැසිරෙන ආකාරය රූප සටහනක දක්වන්න. (ලකුණු 10)

ආ) ඉහත රූප සටහන තුළ කෙටිකාලීන නිෂ්පාදන අවධි වෙන් කර දක්වන්න. (ලකුණු 05)

ඇ) සමනිෂ්පාදිත වක්‍රය අර්ථ දක්වා තාර්කික නිෂ්පාදකයකුගේ සමනිෂ්පාදිත වක්‍රවල ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 05)

05. අ) නිෂ්පාදන පිරිවැය හඳුන්වා, ගණකාධිකරණ පිරිවැය, ආර්ථික පිරිවැය සහ ආවස්ථික පිරිවැය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) මුළු පිරිවැය, සාමාන්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය හඳුන්වා ඒවා රූප සටහන් ආශ්‍රයෙන් නිරූපනය කරන්න. (ලකුණු 10)

06. අ) "පූර්ණ තරඟකාරී ආයතනයකට කෙටි කාලයේ දී අති ප්‍රාමාණික ලාභ ලැබිය හැකි වුවද දිගු කාලයේ දී ලැබිය හැක්කේ ප්‍රාමාණික ලාභ පමණකි." යෝග්‍ය රූප සටහන් ආශ්‍රයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ඒකාධිකාරී වෙළඳපොළ හඳුන්වා ඒකාධිකාරී වෙළඳපොළක කෙටිකාලීන සමතුලිතය රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. අ) "ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළ, පූර්ණ තරඟකාරී සහ ඒකාධිකාරී වෙළෙඳපොළ අතර අතරමැදි වෙළෙඳපොළ තත්ත්වයකි." පැහැදිලි කරන්න. (ලකුණු 12)

ආ) "ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාව කතිපයාධිකාරී වෙළෙඳපොළක විශේෂ ලක්ෂණයකි." පැහැදිලි කරන්න. (ලකුණු 08)

08. ඕනෑම මාතෘකා හතරක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. බද්ද කුලිය
2. මකුළුදැල් න්‍යාය
3. ප්‍රත්‍යක්ෂ වරණ න්‍යාය
4. මිල විශ්ලේෂණය
5. පරිමාණානුකූල ඵල

(ලකුණු 05 බැගින්

*****************************